කඩුවෙල මහා නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර මතය

කඩුවෙල මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ප්‍රමිතියෙහි 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය අනුව අස්තිත්ත්වයක් එහි මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම් ගිණුම්කරණය භාවිතා කර පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ආදායම ලෙස මුදලින් ලද රු. 10,160,169 ක් පමණක් හඳුනාගෙන තිබුණි.	මුදලින් ලද ආදායම පමණක් හඳුනාගෙන ගිණුම් තැබූ බව.	වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ආ)	ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අයවැයගත තොරතුරු කිසිවක් හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේදී එම තොරතුරු සහිතව අවසන් ගිණුම ඉදිරිපත් කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව අයවැයගත තොරතුරු හෙළිදරව් කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. 1,290,000,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස ඇතුළත් නොකිරීම හේතුවෙන් සහ වත්කම් විකිණීමෙන් ලද මුදල් රු. 103,152 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් තුළ වැඩියෙන් දැක්වීම හේතුවෙන්, ආයෝජන ක්‍රියකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 1,290,103,152 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී එම තොරතුරු සහිතව අවසන් ගිණුම ඉදිරිපත් කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

(ඈ)	සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ප්‍රමිතියෙහි 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය තීරණය කිරීමේදී අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් දීමනා රු. 12,567,698 ක් අතිරික්තයට ගැලපිය යුතු වුවද ප්‍රාග්ධන වියදම් දීමනා ලෙස රු. 62,222,716 ක් ගිණුම්කරණ පදනමක් නොමැතිව ගැලපීම හේතුවෙන් රු. 49,655,018 කින් මෙහෙයුම් ක්‍රියාකාරම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියෙහි 4 වන පරිච්ඡේදයේ 4.11 ඡේදය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේදයට අදාළ වැරදි නිවැරදි කිරීම්වල බලපෑම ලෙස අරමුදලට ගලපා තිබුණු රු. 42,449,171 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ හඳුනාගෙන පෙන්වා නොතිබුණු අතර අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගන්නා ලද ප්‍රදාන ගිණුමට ගලපා තිබුණි.	අදාළ වරද නිවැරදි කර ගැනීමට එකඟ වූ බව.	එම
(ඊ)	ප්‍රමිතියෙහි 5 වන පරිච්ඡේදයේ 5.14 (ඇ) හා (ඈ) ඡේද ප්‍රකාරව තොග සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කාලපරිච්ඡේදය තුළදී වියදමක් ලෙස හඳුනාගත් තොගවල වටිනාකම සහ ලියාහැරීම හෝ අලාභ ලෙස හඳුනා ගත් තොග වටිනාකම් හෙළිදරව් කර නොතිබුණි.	ස්ථාවර හා ජංගම වත්කම් වාර්තා කරන කාලයට අදාළව ඉදිරියේදී හඳුනාගත හැකි අවදානමක් නොමැති බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(උ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.13 ඡේදය අනුව වත්කමක් භාවිතය සඳහා ලබාගත හැකි අවස්ථාවේ සිට එය ක්ෂය කිරීම ආරම්භ කිරීම කළයුතු වුවද, ඊට පටහැනිව සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ 3.5 ඡේදයට අනුව වත්කම් මිලදී ගත් දිනය නොසලකා එම වර්ෂය තුළදී ක්ෂය නොකර ඉවත් කිරීම සිදු කරන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරන බව දක්වා තිබුණි.	2025 වර්ෂයේ සිට සභාව මිලදී ගනු ලබන දේපළ පිරියත හා උපකරණ ලබා ගත් වර්ෂයේදීම ක්ෂය කිරීම ආරම්භ කිරීමට කටයුතු කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

	ඒ අනුව 2024 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 261,538,264 ක්වූ දේපළ පිරියත හා උපකරණ සඳහා ප්‍රමිතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට ක්ෂය කර නොතිබූ අතර ඉන් රු. 4,716,889 ක්වූ දේපළ පිරියත හා උපකරණවලට අදාළ වාර්ෂික ක්ෂය රු. 214,859 ක් විය. ඉතිරි රු. 256,821,475ක් පිරිවැය වූ වත්කම් අයිතම මොනවාද යන්න විගණනයට ඉදිරිපත් නොකෙරුණි.		
(ඍ)	ප්‍රමිතියෙහි 11 වන පරිච්ඡේදයේ 11.10 හා 11.11 ඡේද ප්‍රකාරව පිළිවෙලින් මහා නගර සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරා තිබුණු එකතුව රු. 18,100,000 කට අදාළ නඩු 67 ක් පිළිබඳව හා මහා නගර සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරන ලද එකතුව රු. 4,993,450 කට අදාළ නඩු 45 ක් පිළිබද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.	හෙළිදරව් කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කළ යුතුය.
(එ)	ප්‍රමිතියෙහි 15 වන පරිච්ඡේදයේ 15.3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හුවමාරු හා හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ රු. 270,918,952 ක් පැවතුන ද, ඒ මත හානිකරණය සඳහා ප්‍රතිභාගයන් හඳුනාගෙන වෙන්කිරීමක් කර නොමැති බැවින් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ වත්කම් වැඩියෙන් ද විස්තිර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය වැඩියෙන් ද දක්වා තිබුණි.	ඉදිරියේදී ගැලපීම් කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂ කිහිපයක සිට, එක් එක් වර්ෂවලදී රැස්කරගත හැකිව තිබූ මුද්දර ගාස්තු ආදායමට වඩා ඇස්තමේන්තු කළ මුද්දර ගාස්තු ආදායම අඩු වීම මත 2024 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 652,848,723 ක්	ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුද්දර ගාස්තු ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

	වුවද, පෙර වර්ෂ වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ මුදලින් ලද මුද්දර ගාස්තු ආදායම රු. 1,338,583,539 ක් විය. එහි වෙනස රු. 685,734,816 ක් ද ප්‍රවර්තන වර්ෂයේ බිල්කළ ආදායම රු. 671,000,000 ක් ද වර්ෂයේ මුදලින් ලද මුද්දර ගාස්තු ආදායමට ගැලපීමෙන් පසු ලැබෙන ඉතිරි වටිනාකම කලින් ලද මුද්දර ගාස්තු ආදායමක් සේ සලකා ජංගම වත්කම්වල බැර ශේෂයක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ජංගම වත්කම් රු. 14,734,816 කින් අඩුවෙන් දක්වා තිබුණි.		
(ආ)	ලැබිය යුතු මුද්දර ගාස්තුවලට අදාළව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවන ලද උපලේඛනයට අනුව 2022 හා 2023 වර්ෂවලට අදාළ ලැබිය යුතුව පවතින මුද්දර ගාස්තු ආදායම රු. 392,020,279 ක් ද, 2024 වර්ෂයේ බිල්කර ලැබිය යුතුව පැවති රු. 671,000,000 ක මුද්දර ගාස්තු ආදායම ද 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් රු. 1,063,020,279 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුද්දර ගාස්තු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම් රු. 130,135,081 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 120,800,407 ක් ලෙස දැක්වීම හේතුවෙන් වෙනත් විස්තීර්ණ ආදායම හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ද රු. 9,334,674 ක් අඩුවෙන් දක්වා තිබුණි.	එම	ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් සනාථ කරන ලද ස්ථාවර තැන්පතු වටිනාකම රු. 1,842,659,919 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 1,745,551,448 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු. 97,108,471 ක් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	ස්ථාවර තැන්පතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ගිණුමට අනුව 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම ලෙස රු. 134,519,604 ක් දක්වා තිබුණද එදිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 16,025,933 ක් වූයෙන් ජංගම වත්කම් රු. 118,493,671 කින් වැඩියෙන් දක්වා තිබුණි.	වර්ෂයට අදාළ පොලී මුදල පමණක් ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	වර්ෂයට අදාළ පොළී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.7 ඡේදය අනුව අයභාරය හඳුනා ගැනීම උපචිත පදනම මත විය යුතුය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 145,699,277 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 166,958,094 ක් ලෙස දක්වා තිබුණු හෙයින් හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය රු. 21,258,817 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	එම
(උ)	අතුරුගිරිය, කඩුවෙල සහ බත්තරමුල්ල යන ප්‍රදේශවල 2024 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොකළ කාර්මාන්තවලට අදාළව රු. 26,065,672 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	කෙරීගෙන යන වැඩවල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	සභාව විසින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවල 2024 දෙසැම්බර් 31 දිනට ඖෂධ තොගය, මූල්‍ය ප්‍රකාශනවල රු. 10,423,459 ක් ලෙස දක්වා තිබුණද බෙහෙත් ශාලාවලින් ලැබී තිබුණු උපලේඛනවලට අනුව භෞතික ශේෂය රු. 6,052,915 ක් වන බැවින්, ජංගම වත්කම් රු. 4,370,544 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වර්ෂය අවසානයට තොග ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	තොග සාරාංශ උපලේඛනවලට අනුව 2024 දෙසැම්බර් 31 දිනට රු. 44,054,848 ක් වූ භෞතික තොගය,	එම	එම

මූල්‍ය ප්‍රකාශනවල රු. 157,879,708 ක් ලෙස දැක්වීම හේතුවෙන්, ජංගම වත්කම් රු. 113,824,860 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මහා නගර සභාව සතු පුස්තකාල පොත් මිලදී ගැනීම් ගිණුමේ ශේෂය රු. 2,173,533 ක් වූ අතර උපලේඛන අනුව ශේෂය රු. 2,526,678 ක් වූයෙන් රු. 353,145 ක වෙනසක් විය.	අතැති තොග වාර්තා අනුව ශේෂය රු. 2,357,526 ක් බව.	නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මහා නගර සභාව වරිපනම් හා බදු හා කුලී ආදායම් බිල්කිරීම් වටිනාකම් පිළිවෙලින් රු. 253,835,066 ක් හා රු. 22,228,593 ක් වූ අතර උපලේඛන අනුව වටිනාකම් පිළිවෙලින් රු. 233,673,881 ක් හා රු. 22,041,876 ක් වූයෙන් රු. 20,161,185 ක හා රු. 186,717 ක වෙනස්කම් විය.	පිළිතුරු ලබා දී නොමැත.	නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට පියවර ගත යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව		අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභා ආඥා පනත				
	(i)	38 වන වගන්තිය	යාකාළ දියකඩිත්ත මං සන්ධියේ ඉදිකළ මං තීරුව සහ අතුරුගිරිය ස්ටෙල්මේජ් වත්ත නිවාස සංකීර්ණයේ ප්‍රජා ශාලාව වටා ඉදි කළ මං තීරුව	සභාවේ සේවකයින් යොදවා මේ වන විට පිරිසිදු කර ඇති බව.	සභාවට අයිති ඇවිදින මංතීරු සභාව විසින් යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.

		මහජනතාවට භාවිතයට ගත හැකි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාමට සභාව කටයුතු කර නොතිබුණි.		
(ii)	40 (i) හා (iii) වගන්ති	කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලයේ 2024 සැප්තැම්බර් 03 දක්වා ලැබී ඇති විදුලි පැමිණිලි 405 කින් පැමිණිලි 244 ක් එදින වන විට විසඳීමට කටයුතු කර නොතිබුණි. එසේ නොවිසඳන ලද පැමිණිලි අතර මාස 09 ක කාලය ඉක්මවන ලද පැමිණිලි ද විය.	විදුලි පැමිණිලි ඉක්මණින් විසඳීමට කටයුතු කිරීමට නොහැකි වූ බව.	මහා නගර සභා ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මු.රෙ. 102, මු.රෙ. 103 (1) හා 104	තලාහේන සුසාන භූමියේ පිහිටි කඳ කොටස, වට අඩි 09 ත් 9 ½ ත් අතර ප්‍රමාණයකින් යුක්ත වූ තේක්ක ගසේ කඳ කොටස අතුරුදහන් වීම සම්බන්ධයෙන් බලධාරීන් වෙත වාර්තා කර නොතිබුණු අතර පොලිසියට ද වාර්තා කර නොතිබුණි. එමෙන්ම ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට ද කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	මු.රෙ.395 (ඇ)	බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මස අවසානයේ ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළග මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් සභාව විසින් සලකා බලන මාසයට අදාළ බැංකු සැසඳුම පිළියෙල කිරීම සඳහා මාස 02 කට අධික කාලයක් ගත කර තිබුණි.	මෘදුකාංගයේ පවතින අඩුපාඩු මේ වනවිට සකස් කරමින් පවතින අතර වෙනත් මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතින බව.	සෑම මසකම බැංකු සැසඳුම් ඊළඟ මස 15 දිනට පෙර පිළියෙළ කළ යුතුය.
(iii)	මු.රෙ. 396 (ඇ)	සභාව විසින් 2022 ඔක්තෝබර් 01 දින සිට 2024 ජුනි 28 දින දක්වා නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු. 5,808,099 ක් වටිනා චෙක්පත් 90 කට අදාළව මු.රෙ. 396 පරිදි කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2020 පෙබරවාරි 12 දින සිට 2024 නොවැම්බර් 30 දින දක්වා උපලබ්ධි නොවූ රු. 2,476,473 ක් වටිනා චෙක්පත් 42 ක් හා පෙර වර්ෂවලදී හඳුනානොගත් ලැබීම් රු. 3,363,926 ක් හා හඳුනානොගත් ගෙවීම් රු. 12,400 ක් ද නිරවුල් කර නොතිබුණි.	මු.රෙ. 396 පරිදි කටයුතු කර නොමැති බවත්, ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 44 ක් විසඳී ඇති බවත් ඉතිරි චෙක්පත් සහා ආදායමට ගැනීමට අදාළ පූර්ව කටයුතු සිදුකරමින් පවතින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) ඡේදය			
	(i)	සීමාව ඉක්මවා රු. 2,845,572 ක අතුරු අග්‍රිම අවස්ථා 09 කදී ගෙවා තිබුණි.	සභාවේ සේවා අවශ්‍යතාවය අනුව පරිපාලන කමිටු තීරණ ලබාගෙන මෙම	චක්‍රලේඛය ප්‍රකාරව අතුරු අග්‍රිම ලබා දිය යුතුය.

			අත්තිකාරම් මුදල් ලබා දී ඇති බව.	
	(ii)	අවස්ථා 59 කදී ලබා දී තිබුණු රු. 7,022,838 ක තත්ත්කාර්යය අතුරු අග්‍රිම පියවීමට දින 14 සිට 263 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුව තිබුණි.	නාගරික ගණකාධිකාරී වෙත අත්තිකාරම් පියවීමට දැනුම්දීම පිළිබඳව උපදෙස් ලබාදීමට කටයුතු කළ බව.	කාර්යය නිම කළ විගසම තත්කාර්යය අතුරු අග්‍රිම පියවිය යුතුය.
	(iii)	2024 නොවැම්බර් 25 වන දින ලබාදී තිබුණු රු. 160,000 ක අත්තිකාරමක් අදාළ කාර්ය ඉටු නොකර දින 20 ක් එම නිලධාරියා භාරයේ රඳවා ගෙන තිබුණි.	ඉදිරියේදී අත්තිකාරම් ලබාගන්නා අවස්ථාවේදී අදාළ නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු කරන බව.	අත්තිකාරම් ලබාදීම හා පියවීම විධිමත් කළ යුතුය.
(ඇ)	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2024ජනවාරි 10 දින නිකුත් කරන ලද අංක: 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	ජාතික උත්සව ලෙස වාර්ෂික ඇස්තමේන්තුවල නිශ්චිතව සඳහන් කර නොමැති, ප්‍රතිපාදන වෙන්කර නොමැති නත්තල් උත්සවයක් සඳහා 2024 දෙසැම්බර් 21 වන දින රු. 536,250 ක වියදමක් මහා නගර සභාව විසින් වැයකර තිබුණි.	රටෙහි පවතින ආර්ථික තත්වය මත නත්තල් උත්සවය සඳහා වැය වූ වියදම මෙම වසරේ දී ප්‍රමාණාත්මක ව වැඩි වී ඇති බව.	ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 73,602,936 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 62,486,268 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු රු. 600,328 ක ශේෂයක් සහිත ජංගම ගිණුමක් 2011 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පැවැතුණි.	ගිණුමෙහි මුදල් සභාවේ දැනට ගනුදෙනු කරන ගිණුමට මාරුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	අක්‍රිය බැංකු ගිණුම වසා මුදල් ශේෂය සභාවේ ජංගම ගිණුමට මාරු කර ගත යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.000	බිල් කළ ආදායම රු.000	රැස්කළ ආදායම රු.000	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000	ඇස්තමේන්තුගත ආදායම රු.000	බිල් කළ ආදායම රු.000	රැස්කළ ආදායම රු.000	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000
(i)	වරිපම් හා බදු	206,647	215,641	141,562	74,079	189,810	210,079	172,380	37,700
(ii)	කුලී	11,694	13,431	12,513	918	9,924	9,557	11,098	0
(iii)	බලපත්‍ර ගාස්තු	10,135	10,463	12,728	(2,265)	10,335	10,335	11,504	0
(iv)	වෙනත් ආදායම්	40,689	40,689	36,846	3,842	14,843	14,843	14,604	239
		269,165	280,224	203,649	76,574	224,912	244,814	209,586	37,939

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම්		
2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 ට වඩා වැඩි හිඟ වරිපනම් ආදායම රු. 42,498,260 ක් විය.	සටහන් අංක 06 හි වරිපනම් හා බදු යටතේ වාර්ෂික බිල්කිරීම් හා රැස්කළ ආදායම් නිරූපණය වන බව.	හිඟ වරිපනම් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) විනෝද බදු		
2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 ට වඩා වැඩි හිඟ විනෝද බදු ආදායම රු. 5,388,708 ක් විය.	තොරතුරු ලද පසු නැවත නඩු පැවරීමට කටයුතු කරන බවත්, සිනමා ශාලාවක් වෙතින් අයවීමට ඇති හිඟ ආදායම් සඳහා කඩුවෙල දිසා අධිකරණයේ නඩු පවරා ඇති බව.	හිඟ විනෝද බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු		
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත්	වර්ෂයට අදාළ උසාවි දඩ මුදල් ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන	හිඟ ආදායම් අය කරගැනීමට කටයුතු

	බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 33,215,478 ක් විය.	මේ වන විට සකස් කරමින් පවතින බව.	කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා සභාව විසින් රු.මිලියන 4.4 ක වියදමක් දරා ආරම්භ කර තිබුණු ජීව වායු උත්පාදිත ව්‍යාපෘතිය මඟින් උත්පාදිත විදුලිය Net Metering ක්‍රමයට විදුලිබල මණ්ඩලයට ලබා දීම සඳහා 2023 පෙබරවාරි 21 දින ගිවිසුමකට එළඹ තිබුණද, ජාතික විදුලි පද්ධතියට විදුලිය ලබා දීමට හැකිව තිබුණේ මාස 07 ක් පමණි. ජීව වායු ඒකකය මාස 02 ක් පමණක් උපරිම ධාරිතාවයකින් ක්‍රියාත්මක වී තිබුණු නමුත් මාස 10 ක් ම නිශ්ක්‍රිය තත්ත්වයෙන් පැවතීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	ජීව වායුව මඟින් ජාතික විදුලි බල පද්ධතිය වෙත විදුලිය ලබාදෙනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ලැබී නොමැති බව.	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කළ යුතුය.
(ආ)	අතුරුගිරිය ස්ටෙල්මේජ් වත්ත සදාසිරිපුර නිවාස සංකීර්ණය අසල ප්‍රජා ශාලාව වටා සභා අරමුදල් වැය කර ඉදිකර තිබුණු ඇවිදින මංතීරුව 2018 අගෝස්තු, සැප්තැම්බර් මාස වල දී කොන්ක්‍රීට් ගල් අතුරා නවීකරණය කිරීම සඳහා සභාව විසින් රු. 781,722 ක් වැය කර තිබුණි. එහෙත් එම මංතීරු විධිමත්ව නඩත්තු නොකිරීම නිසා නැවත විශාල වියදමක් දරා අලුත්වැඩියා කිරීමට සිදුව ඇති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	එම මං තීරුව සභාවේ සේවකයින් යොදවා මේ වන විට පිරිසිදු කර ඇති බව.	සභාව සතු වත්කම් යාවත්කාලීනව නඩත්තු කළ යුතුය.

(ඇ)	දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු. 285,111,688 ක් සහ කර්මාන්ත ණයගැති ශේෂය රු. 83,178,515 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ අතර ශේෂය රු. 161,870,387 ක් වූ කෙරීගෙන යන වැඩවලට අදාළ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	කාල විශ්ලේෂණය සකස් කර ඇති අතර එම වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරන බව.	කාල විශ්ලේශණ නියමිත පරිදි සකස් කර උපලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 දෙසැම්බර් 31 දින කර්මාන්ත ණයගැති ශේෂය රු. 83,175,515 ක් විය. කර්මාන්ත ණයගැති උපලේඛනවලට අනුව 2024 වර්ෂයේ බිහි වූ කර්මාන්ත ණයගැතියන් රු. 46,009,993 ක් වුවද ඉකුත් වර්ෂවලට අදාළ ණයගැති උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා උක්ත ශේෂ සැසඳීමට නොහැකි විය.	පිළිතුරු ලබා දී නොමැත.	නියමිත පරිදි උපලේඛන සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	මූල්‍ය ප්‍රකාශන තුළ ගබඩා ණයහිමි අවසාන ශේෂය රු.190,181,813ක් ලෙස දක්වා තිබුණද, 2024 දෙසැම්බර් 31 දිනට ගබඩා ණයහිමි ශේෂය ලෙස උපලේඛනවල රු.23,741,657ක් වූ වර්ෂය තුළ බිහිවූ ගබඩා ණයහිමියන් පමණක් දක්වා තිබුණු අතර, ඊට පූර්ව වර්ෂවල බිහි වූ ගබඩා ණයහිමියන් ඇතුළත් කර නොතිබුණු හෙයින් විගණනයේදී සැසඳීමට නොහැකි විය.	පිළිතුරු ලබා දී නොමැත.	නියමිත පරිදි උපලේඛන සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.

3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභාවට අයත් ජයවඩනගම ගීගංගා උත්සව ශාලාව මාසික බදු කුලිය රු. 70,000 ක් බැගින් හා වාර්ෂිකව සියයට 10 ක් බැගින් වැඩිවීමේ කොන්දේසිය මත 2018 නොවැම්බර් 07 දින බදුකරු සමඟ වර්ෂ 05 ක බදු ගිවිසුමකට එළඹ තිබුණි. 2020 සැප්තැම්බර් සිට 2023 මැයි මාසය දක්වා මාස 33 ක කාලයක් සඳහා සමුච්චිත හිඟ බදු කුලී සහ අධි ගාස්තු ලෙස රු. 2,894,772 ක මුදලක් බදුකරුගෙන් ලැබිය යුතුව තිබුණ ද, ගිවිසුම ප්‍රකාරව කටයුතු කර එම හිඟ මුදල අයකර ගෙන නොතිබුණි. 2023 සහ 2024 වර්ෂවලදී උත්සව ශාලාවේ නවීකරණ කටයුතු ප්‍රජා මණ්ඩල දෙකක් මඟින් අදියර 02 ක් යටතේ සිදු කර ඒ සඳහා සභා අරමුදලින් පිළිවෙලින් රු. 3,000,000 ක් හා රු. 4,000,000 ක් ගෙවා තිබුණ ද,එම කටයුතු අධීක්ෂණය කර නොතිබුණි. එමෙන්ම, එකී ගිවිසුමේ කොන්දේසි අංක 7 (1) ප්‍රකාරව උත්සව ශාලාවේ පිටත ඉදිකිරීම් හා පොදු ස්ථානවල නඩත්තුව හා අලුත්වැඩියාවන් සභාව විසින් කලින් කල සිදු කළ යුතු වුවත්, බදුකරු විසින් ඔහුගේ පෞද්ගලික වියදමින් රු.ලක්ෂ 90 ක් උත්සව ශාලාවේ නවීකරණ කටයුතු සඳහා වැයකර තිබූ බව 2022දෙසැම්බර් 05 දින දන්වා තිබිය දී ඒ පිළිබඳව ද විධිමත් අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.	ජයවඩනගම ගීගංගා උත්සව ශාලාව අළුත්වැඩියා කර මේ වන විට මසකට රු. 100,000 බැගින් අයකර ගැනීමට ගිවිසුම්ගතව අයෙකුට පවරා ඇති බව.	ගිවිසුම් ප්‍රකාරව හිඟ හිටි බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර නවීකරණ කටයුතු සභාවේ අධීක්ෂණයට ලක්විය යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජුලි 25 දින පුටු මිලදීගත් ආයතනයෙන් පුටුවක් රු. 1900 ක මුදලකට මිලදී ගැනීමට පරිපාලනය තීරණ ගෙන තිබියදීත් අදාළ විෂයභාර නිලධාරියා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශයට පටහැනිව 2024 ජුලි 30 දින මාසයක් ගතවීමට පෙර නැවත මිල ගණන් කැඳවීමෙන් ලැබූ අවම මිල වන රු. 2,850 බැගින් රු. 200,000 ක් වටිනා පුටු 70 ක් මිලදී ගැනීම හේතුවෙන් සභාවට රු. 66,500 ක අලාභයක් සිදු වී ඇති හෙයින් එම අලාභය, අදාළ විෂයභාර නිලධාරියාගේ	2024 අප්‍රේල් 24 දිනැති පරිපාලන කමිටු තීරණ අංක 156 අනුව නැවත මිළ ගණන් කැඳවීමට සිදු වූයේ කලින් මිලදී ගත් ප්‍රමාණය පුටු 100 ක් වූ අතර එම ප්‍රමාණයෙන් සියයට 50 කට වඩා වැඩියෙන් මිලට ගැනීමට අදහස් කළ බැවින් බව.	අලාභය විෂයභාර නිලධාරියාගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නොසැලකිල්ල හේතුවෙන් සිදු වී තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තියට පටහැනිව අවුරුදු 07 ක කාලයක සිට පුරප්පාඩුව පැවති ආයතනයේ ප්‍රධාන තනතුරක් වන නාගරික ලේකම් තනතුර සඳහා නිත්‍ය පත් කිරීමක් සිදු නොකර පුරප්පාඩු වූ දින සිටම වැඩ බැලීමේ පත් කිරීමක් සිදු කර තිබුණි.	මෙම තනතුරු පුරප්පාඩුව පවතින බව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පෙන්වා දීම අඛන්ඩව සිදු කර ඇති බව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිත්‍ය නිලධාරියෙක් පත්කර එවූ වහාම මෙම පත් කිරීම අවලංගු කිරීමට කටයුතු කරන බව.	නාගරික ලේකම් තනතුර සඳහා නිත්‍ය පත්කිරීමක් සිදු කර ගත යුතුය.
(ආ)	තෘතියික සේවා කාණ්ඩයේ අනුමත තනතුරු 07 අතුරින් තනතුරු 03 ක් 2024 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවති අතර සේවයේ යෙදී සිටින නිලධාරීන් 04 දෙනෙකුගෙන් එක් නිලධාරිනියක් නාගරික ලේකම් ධූරයේ වැඩ බැලීම හේතුවෙන් පරිපාලන නිලධාරී තනතුරක් පුරප්පාඩු වී තිබුණි.	නාගරික කොමසාරිස් වෙත පැවරී ඇති සභාවේ බලතල ප්‍රකාරව මෙම පත්කිරීම් සිදු කර ඇති බව.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ආදායම් පරීක්ෂක (විශේෂ) තනතුර අවුරුදු 08 ක සිටද භාෂා පරිවර්තක තනතුර අවුරුදු 12 ක සිටද පුරප්පාඩු වී තිබුණි. ආදායම් හා සම්බන්ධ ප්‍රධානම තනතුර අනුමත වූ දින සිටම පුරප්පාඩු වී තිබීම නව ආදායම් මාර්ග හඳුනා ගැනීම, ආදායම් රැස් කිරීම හා හිඟ හිටි ආදයම් ලබා ගැනීමට කටයුතු කිරීම ආදිය කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.	නඩුව අවසන් වන තුරු තනතුර සඳහා වන බඳවා ගැනීම් තහනම් කර ඇති නිසා පුරප්පාඩු ලෙස පවතින බව.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.
(ඈ)	අනුමත ආදායම් පරීක්ෂක තනතුරු 12 ක් අතරින් තනතුරු 09 ක් ම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආදායම් රැස් කිරීමේ වගකීම ක්ෂේත්‍ර කම්කරුවන් හා සෞඛ්‍ය කම්කරුවන් වෙත පවරා තිබුණි.	නඩුව මත බඳවාගැනීම අත්හිටුවා ඇති බැවින් වෙනත් තනතුරුවල සේවකයින්ට එම වගකීම් ලබා දී ඇති බව.	නීති ක්‍රියාමාර්ග අවසන් වූ වහාම පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය.

(ඉ)	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 195 ඡේදයේ 06 වන සහ 203 වන ඡේදයට පටහැනිව ජ්‍යෙෂ්ඨ, තෘතික හා ද්විතික මට්ටමේ නිලධාරීන් 133 දෙනාගෙන් 59 දෙනෙකුම වසර 04 - 29 ක් අතර දීර්ඝකාලයක් අඛණ්ඩව සභාවේ සේවයේ නියුතුව තිබුණි.	මීළඟ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන විටදී වසර 05 ඉක්ම වූ නිලධාරීන්ට ස්ථාන මාරු සඳහා අයදුම්කළ හැකි බව.	වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රියාකාරී සැලැස්ම		
2024 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය වෙනුවට, විගණනයට ඉදිරිපත් කර තිබූ පාලන වාර්තාවේ වර්ෂයේ ප්‍රගතිය මූල්‍යමය වශයෙන් මැනීමට ප්‍රමාණවත් තොරතුරු අන්තර්ගතව නොතිබුණි. එක් එක් වැඩසටහනට අදාළව වෙන් කළ ප්‍රතිපාදන වටිනාකම සහ ප්‍රතිපාදන උපයෝජනය සම්බන්ධව විස්තර සඳහන් නොවීම නිසා මූල්‍ය කාර්යසාධනය ගණනය කළ නොහැකි විය.	ක්‍රියාකාරී සැලැස්ම මූල්‍යමය වශයෙන් මැනීමට හැකි වැඩසටහන්වල ප්‍රගතිය ඇතුළත් වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරන බව.	ක්‍රියාකාරී සැලස්මේ ප්‍රගතිය මූල්‍ය කාර්යසාධනය ගණනය කළ හැකි පරිදි ව ඉදිරිපත් කළ යුතුය.